37 වන පිටෙන්

විය. එසේ වුවද ඔබාමා ඇමරිකාව වෙනුවෙන් කළ යුතු යුතුකම් හැකි ඉහළම අන්දමින් ඉටුකරමින් තිබේ. මෙවර ජනාධිපතිවරණයට ඔබාමා මුහුණ දෙන්නේ එලෙස ඇමරිකානුවන්ගේ අපේක්ෂා දැල්වූ ජන නායකයකු ලෙසිනි.

රොම්නි ජනාධිපතිවරණයට ඉදිරිපත්වෙන පසුබිම ඊට වෙනස්ය. ඔහු ඉදිරිපත්වෙන්නේ ඇමරිකානුවන්ගේ අපේක්ෂා දල්වන්නට අවස්ථාවක් ඉල්ලමිනි. ඔහු දල්වන්නට අපේක්ෂා කරන අපේක්ෂා මොනවාද? රූපවාහිනී සංවාදවලින් හෙළිදරව් කෙරුණේ බොහෝ විෂයයන්ට අදාළව ඔහු



කරන්නට අපේක්ෂා කරන්නේ ද ඔබාමා කරන්නට අපේක්ෂා කරන දේවල්ම බවය.

ඔක්තෝබර් 22 දින පැවැති අවසන් රූපවාහිනී සංවාදයේ මාතෘකාව වූයේ ඇමරිකාවේ විදෙස් ප්‍රතිපත්තියයි. විනාඩි 90ක් පැවැති මේ සංවාදයේදී ඔබාමා හෙළිදරව් කරන ලද විදෙස් ප්‍රතිපත්තිය මුළුමනින්ම පාහේ රොම්නිද අනුමත කළේය. රොම්නිට ඇත්තේද ඔබාමාගේ විදෙස් ප්‍රතිපත්තියම බව ඉන් පැහැදිලිය. එය පුදුමයට කරුණක් නොවේ. මන්ද ඇමරිකාවේ ජනාධිපති පුටුවේ කවුරුන් ඉදගත්තද ඉදිරියට ගෙනියන්නට සිදුවන්නේ ඇමරිකානුවන්ගේ විදෙස් ප්‍රතිපත්තිය මිස තමන්ගේ ප්‍රතිපත්තියක් නොවන බැවිනි. එබැවින් ඔබාමාද රොම්නිද එකම කාසියේ දෙපැත්තය. නෝනා වැටුණද පොල්ල වැටුණද වෙනස ඇත්තේ මුහුණතේ පමණකි.

ඇමරිකාවේ ජනාධිපතිවරණය ලෝක ප්‍රජාවට වැදගත් වන්නේ පත්වන පුද්ගලයා අනුව ඇමරිකාවේ ලෝක පොලිස්කාර භූමිකාවේ වෙනසක් ඇතිවන්නේ නම් පමණි. එවැන්නක් නොවන බවට හොඳම උදාහරණය සපයන්නේද ඔබාමාය. ඔහු බලයට පත්වන විට ලෝක ප්‍රජාව මූලිකව අපේක්ෂා කළ දේවල් කීපයකි. මුස්ලිම් ප්‍රජාව සමඟ ඇමරිකාවේ හොඳ හිත වර්ධනය කෙරෙනු ඇතැයි ලෝකය බලාපොරොත්තු තැබුවේය. ඇෆ්ගන් යුද්ධය අවසන් කරනු ඇතැයි ලෝකය බලාපොරොත්තු විය. ආක්‍රමණශීලී මැදිහත්වීම් අවම වනු ඇතැයි ලෝකය බලාපොරොත්තුවිය. එහෙත් ඒ එකක්වත් සිදුවූයේ නැත.

එබැවින් ඇමරිකාවේ නව ජනාධිපතිවරයා ලෙස නැවත වරක් ජනපති ඔබාමාගේ පත්වීම යනු ලෝකයේ ගමන් මග කෙරෙහි අමුතු වෙනසක් ඇති කරලන්නක් නොවනු ඇත. ඔබාමා විසිවී රොම්නි ජනපති ධුරයට පත්වීමද එසේමය.

ශ්‍රීලාල් සෙනෙවිරත්න








